**විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල - 2014**

----------------------------------------------

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 12(5) උප වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**2.1 මතය**

-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට රු. 6,903,570 ක් වූ හඳුනා නොගත් දායක මුදල් 2014 වර්ෂයේ දී ද හඳුනා ගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එම අගය රු.6,954,807 ක් දක්වා වර්ධනය වී තිබුණි. යථෝක්ත වටිනාකම අවසන් ගිණුම් වල නොඉල්ලූ ප්‍රතිලාභ සංචිතයට බැර කර තිබුණි.**(Unclaimed Benefits Reserve)**

(ආ) අර්ථසාධක අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට රු. 40,352,106 ක අක්‍රීය සාමාජික ශේෂයක් පෙන්නුම් කරනු ලබන අතර, එම ශේෂය තුළ ඇතුලත් ගිවිසුම් කඩ කිරීම වෙනුවෙන් ආයතනයට ලැබිය යුතු මුදල් ප්‍රමාණය හඳුනාගෙන ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි. එසේම අක්‍රීය සාමාජිකයන් වෙනුවෙන් **සමාලෝචිත වර්ෂය** සඳහා රු.5,875,548 ක් පොළී වශයෙන් ද ගෙවීම් කර තිබුණි.

**2.3 ගෙවිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.26,351,592 ක ගෙවියයුතු අර්ථසාධක අරමුදල් (Refunds Payable ) ශේෂය තුළ වර්ෂ 01 සිට 13 දක්වා කල් ඉකුත් වූ ගෙවියයුතු අර්ථසාධක අරමුදල් ශේෂය රු.24,373,385 ක් විය. මෙම මුදල් නිරවුල් කිරීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

**2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.**

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය

| **නීති, රීති සහ රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 92 (3) ඡේදය | වාර්ෂික මිශ්‍ර පොලිය තීරණය කිරීම , මුදල් විෂයභාර අමාත්‍යාවරයාගේ අනුමැතිය සහිතව අදාල අමාත්‍යාවරයාගේ තීරණය මත හා නියමාවලියේ විධිවිධාන වලට යටත්ව සිදුවිය යුතු වුවද 2014 වර්ෂයේ අදාළ පොළී අනුපාතයන් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාවරයාගෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) 2014 දෙසැම්බර් 29 දිනැති අංක 06/2014 දරන කොමිෂන් සභා මුල්‍ය චක්‍රලේඛය | 2014 නොවැම්බර් මාසයට අදාල දායකමුදල් හා ණයවාරික ලැයිස්තු 2014 දෙසැම්බර් 15 දින හෝ එදිනට පෙර ද , 2014 දෙසැම්බර් මාසයට අදාල දායක මුදල් හා ණය වාරික ලැයිස්තු 2015 ජනවාරි 15 දින හෝ එදිනට පෙර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලැබිය යුතු වුවද ආයතන 9 කට අදාල රු.8,696,900 ක දායක මුදල් හා රු.1,113,350 ක ණය වාරික සම්බන්ධ ලැයිස්තු නියමිත කාලපරිච්ඡේදය තුළ අර්ථසාධක අරමුදල වෙත ලබා දී නොතිබුණි. |
| (ඇ) 2001 පෙබරවාරි 02 දිනැති අංක 03/2001 දරන කොමිෂන් සභා මුල්‍ය චක්‍රලේඛය | කිසියම් මාසයකට අදාළ අර්ථසාධක දායක මුදල් ඊළඟ මාසයේ 10 වෙනි දිනට පෙර හෝ එදින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලැබිය යුතු වුවද නියැදි පරීක්ෂාව අනුව මාස පහකට අදාල දායක මුදල් |

අර්ථසාධක අරමුදල වෙත නොලැබුණු අවස්ථා 35 ක් විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඈ) 2007 ඔක්තෝබර් 27 දිනැති අංක 45 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3 ඡේදය

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීමේ ප්‍රකාශනයක් ඉදිරිපත් කළ යුතු වුවද එවැනි ප්‍රකාශනයක් ඉදිරිපත් කර නොතිබුණි.

3. **මූල්‍ය සමාලෝචනය**

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.2,541,161,941 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.2,259,182,079 ක අතිරික්තයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.281,979,862 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී ශුද්ධ ආයෝජන ආදායම් රු.274,779,176 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය කෙරෙහි විශේෂයෙන් බලපා තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

**4.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල 03 ක සිදුකළ නියැදි පරීක්ෂාවේදී ගිවිසුම් කඩකළ නිළධාරීන්ගෙන් විශ්වවිද්‍යාල වෙත අයවිය යුතු බැඳුම්කර වටිනාකම රු.78,289,363 ක් වූ අතර අදාළ නිළධාරීන්ගේ රු.51,269,542 ක අර්ථසාධක අරමුදල් ශේෂ පැවතුනද යථෝක්ත මුදල් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) මොරටුව විශ්වවිද්‍යාලයේ සාමාජිකයන් 03 දෙනෙකුගෙන් ගිවිසුම් කඩ කිරීම නිසා රු.13,787,699 ක මුදලක් අය කර ගැනීමට තිබියදී එම නිළධාරීන්ට හිමි අර්ථසාධක මුදල් නිදහස් කර තිබුණු අතර අයවිය යුතු ශේෂ අයකර ගැනීම සඳහා විගණිත දිනය දක්වාම නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) හිඟ ජීවන වියදම් පියවීම සඳහා 2012 සහ 2014 වර්ෂයන්හි භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු. මිලියන 171.7 ක මුදලක් අදාල හිඟ ජීවන වියදම් දීමනාව ගණනය කර විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සාමාජික ගිණුම් වෙත බැර කිරීමට කටයුතු කර නොතිබුණි. විශ්වවිද්‍යාල විසින් මේ සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් අදාල සාමාජිකයන් වෙත මුදල් බැර කිරීමට නොහැකි වූ බව අරමුදලේ සභාපතිවරයා විසින් විගණනය වෙත වාර්තා කර තිබුණි.

**5.** **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1** **අයවැය ලේඛනමය පාලනය**

1977 අගෝස්තු 16 දිනැති අංක 836 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ (අ) ඡේදය අනුව ව්‍යවස්ථාපිත නීතිය යටතේ ඇතිකරනු ලැබූ අරමුදල් සඳහා වාර්ෂික අයවැය ලේඛනයක් පිළියෙල කළයුතු වුවද යථෝක්ත චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

6. **පද්ධති හා පාලනයන්**

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අරමුදලේ ලේකම්වරයා වෙත වරින් වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමුකල යුතුය.

(අ) සාමාජික අරමුදල් පාලනය

(ආ) අයවැය ලේඛනමය පාලනය